## නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය

# නාගරික සංවර්ධන අධිකාරිය

## මධ්‍යම ආදායම් ලාභී නිවාස ව්‍යාපෘතිය

# ඇබෑර්තු

පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුර පිරවීම සඳහා අවශ්‍ය පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. අදාල අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද සතු අය විය යුතුය.

## නීති නිලධාරී - (PS 5) - තනතුරු 01

**සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාල ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාල ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්,

හෝ

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් අදාල ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,

සහ

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද

**වැදගත් :** බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව අවුරුදු 64 කි.

**පොදු කොන්දේසි :**

අදාල පත්කිරීම්, මූලිකව වසර 01 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනමින් සිදු කරනු ලබන අතර, ඉන් පසුව, සතුටුදායක කාර්ය සාධනය මත වාර්ෂිකව අලුත් කළ හැකිය. ද්විතියක පදනමින් පත්කිරීම ද සලකා බැලිය හැක. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අදුම්කරුවන් තම අයදුම්පත් අදාල ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ.

**වැටුප් :** 2019.03.05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි විධිවිධාන ප්‍රකාරව වේ.

සම්පූර්ණ ජීවදත්ත සහිත අයදුම්පත්, අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ඇතුලත්ව, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර සමග ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතුය. අයදුම් කරනු ලබන තනතුර අදාල අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය. සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම්පත සමග අමුණා තිබිය යුතුය. සියලුම අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**සභාපති,**
**නාගරික සංවර්ධන අධිකාරිය,**
**09 වන මහල,**
**සෙත්සිරිපාය, බත්තරමුල්ල.**